**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2016**

-----------------------------------------------------------------------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 ජනවාරි 03 දිනැති අංක 1843/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ 2013 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 21 වන වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය, 108 සහ 111 වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 ආයතනය පිහිටුවීම**

**-----------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2014 ජනවාරි 03 දිනැති අංක 1843/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2013 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය අනුව 2015 දෙසැම්බර් 15 දින මෙම ආයතනය පිහිටුවා තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**-------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2. නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**-------------------------------------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව<br>------------------------------------- | අනුකූල නොවීම්<br>--------------------- |
|---|---|---|
| (අ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | පර්යේෂණ දීමනාව ලබා ගැනීමට සුදුසුකම් ලබන නිලධාරීන් විසින් පර්යේෂණ යෝජනාවේ ප්‍රගතිය පිළිබඳ වාර්තා, පර්යේෂණය කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කල යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබිය දී, සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරියෙකු වෙත රු.242,823 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ II කොටස<br>------------------------------------<br>VIII පරිච්ඡේදයේ 6.2 හි (ii) හා (iii) වගන්තිය | තම රාජකාරියට අමතරව කරන සේවාවකින් උපයාගන්නා ගාස්තුවෙන් සියයට 10 ක කොටසක් තමන් අයිති උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතුය. එහෙත් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.18,936,884 ක බාහිර දේශන ගාස්තුවලින් රු.1,893,688ක් ගාස්තුව ගෙවන අවස්ථාවේදී අවකරණය කර විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
| --- | --- | --- |
| (ඈ) | 1994 ජුනි 14 දිනැති අංක 95(02) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2003 ජනවාරි 09 දිනැති අංක PE1/174/1-2003 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 16 දෙනෙකු සඳහා සම්බන්ධීකරණ දීමනා ලෙස රු.273,500 ක්ද, එක් නිලධාරියෙකු සඳහා ගෞරවාන්විත දීමනා ලෙස රු.9,000 ක්ද ලෙස එකතුව රු. 282,500 ක් චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස ගෙවා තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ රු.20,000,000 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවීමෙන් පසු ප්‍රථම වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ අතිරික්තය රු.11,646,388 ක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

2013 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය අනුව ආයතනයේ අරමුණු පහත දැක්වේ.

(අ) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා ක්ෂේත්‍ර වල පශ්චාත් උපාධි උපදේශන, පුහුණුව සහ පර්යේෂණ සැපයීම;

(ආ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව සහ කොමිෂන් සභාවෙන් එකඟත්වය ඇතිව මානව හා සමාජ විද්‍යාව පිළිබඳ ඇතැම් ක්ෂේත්‍ර වෙත ප්‍රදානය කරනු ලැබිය යුතු පශ්චාත් උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිළිබඳ තීරණය කිරීම

(ඇ) ආයතනයේ අරමුණුවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශීය වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමග ආචාර්යවරයන්, ශිෂ්‍යයන් සහ ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරව සහයෝගයෙන් ක්‍රියාකිරීම;

(ඈ) ආයතනයට ප්‍රවේශ වීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන් විසින් හෝ ආයතනයේ ශිෂ්‍යයන් විසින් විශ්වවිද්‍යාලවලදී සහ විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යයන ආයතනවලදී සමත් විභාග සහ ගතකල අධ්‍යයන කාල සීමාව හෝ හැදෑරූ අධ්‍යයන විෂය, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි පරිදි, ආයතනයේ යම් විභාගවලට සහ ඉගෙනීමේ හෝ අධ්‍යයන කාල සීමාව හෝ ඉන් යම් කොටසකට හෝ සමාන බවට පිළිගැනීම සහ ඕනෑම අවස්ථාවක එම පිළිගැනීම ඉවත් කර ගැනීම;

(ඉ) විශ්වවිද්‍යාලය විමසා ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව, ජාත්‍යදක්ෂිණ, ආධාර ශිෂ්‍යත්ව, දීමනා,පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇතිකිරීම සහ ප්‍රදානය කිරීම;

(ඊ) පර්යේෂණ සහ අධ්‍යයන පාඨමාලා හෝ අධ්‍යයන පාඨමාලාවලින් කොටසක් ආයතනයෙන් බාහිරව පැවැත්වීම සඳහා විධිවිධාන යෙදිය යුතු යයි නියම කෙරෙන යම් අතුරු ව්‍යවස්ථාවකට අනුකූලව පර්යේෂණ, අධ්‍යයන පාඨමාලා හෝ පාඨමාලාවලින් කොටසක් හෝ ආයතනයෙන් බාහිරව පැවැත්වීමට කටයුතු පිළියෙල කිරීම;

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමාලෝචිත වර්ෂයට (අධ්‍යයන වර්ෂයට) සිසුන් 810 ක් බඳවාගෙන තිබුණද, සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තා පිළියෙල කර නොමැති බැවින් ආයතනයේ කාර්යසාධනය පරීක්ෂා කිරීම ගැටළු සහගත විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

------------------------------

2015 සැප්තැම්බර් 15 දින නීත්‍යානුකූලව ස්ථාපිත කර ඇති මෙම ආයතනය, වසරකට අධික කාලයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් ස්ථාවර වත්කම් අයිතම් 46 ක් පරිහරණය කරමින් එම විශ්වවිද්‍යාලයට අයත් ගොඩනැගිල්ලක පවත්වා ගෙන යන නමුත් එහි නීත්‍යානුකූල අයිතිය පවරා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

------------------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයට අයත් අරමුදල් ගිණුමක් මගින් පශ්චාත් උපාධි පාඨමාලා පවත්වාගෙන ගොස් තිබූ අතර, වෙනම ආයතනයක් ලෙස පිහිටුවා ගැනීමෙන් පසු එම අරමුදලේ පැවැති රු.13,231,258 ක ශේෂය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

-------------------------------

ආයතනයට අයත් කාර්ය මණ්ඩලයේ ස්ථිර කාර්මික නිලධාරියෙකු හා ලඝුලේඛකයෙකු පුරප්පාඩු වී ඇතත් බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.2 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ගිණුම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ආයතනයේ 2016 වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශන, විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2017 ජූනි 06 දිනදීය.

**5.2 සංයුක්ත සැලැස්ම**

---------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදයේ 02 වගන්තිය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.

**5.4 අභ්‍යන්තර විගණනය**

මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව, කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කර ඉලක්ක දිනයන්හිදී කළමනාකරණ හා විගණන කමිටුවේ සාකච්ඡාවට ඉදිරිපත් කර නොතිබුණි.

**5.5 විගණන කමිටු**

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඞී/12 හි 7.4.1 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් මාස 03 කට වරක් හෝ විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත්, මෙම ආයතනය සමාලෝචිත වර්ෂයේ විගණන කමිටු රැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි.

**5.6 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී විෂයයන් 20 ක සියයට 20 සිට සියයට 595 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | වත්කම් විධිමත් පරිදි පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) | අත්තිකාරම් පාලනය | අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා අත්තිකාරම් ගෙවීම් කිරීම. |